අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்லை, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/10/06/(II) | ඔබේ යොමුව / உமது இல. / Your Ref. | දිනය / திகதி / Date 2024.01.31

සියලු ම විදුහල්පතිවරුන් වෙත.

**<u>පාසල තුළ පන්ති කව පැවැත්වීම සම්බන්ධ මාර්ගෝපදේශ</u>**

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රශස්ත මට්ටමෙන් පවත්වා ගැනීම හා පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ගුරුවරුන් හා දෙමාපියන් අතර අන්තර්සම්බන්ධතා ශක්තිමත් කිරීමේ අරමුණ පෙරදැරිව පාසල් පන්ති කව පැවැත්වීමට 2023.12.29 දිනැති අංක 54/2023 දරන චක්‍රලේඛයේ 4.7 වගන්තිය මගින් උපදෙස් ලබා දී ඇත. එම උපදෙස් අනුව පාසල් පන්ති කව පැවැත්වීමේ දී පහත කරුණු කෙරෙහි ද අවධානය යොමු කර දෙමාපියන් දැනුම්වත් කිරීමට කටයුතු කළ යුතු බව කාරුණික ව දන්වමි.

1. පන්ති කවවල දී යම් සිසුවකු හෝ දෙමාපියකු හෝ අනෙක් සිසුන් සහ දෙමාපියන් ඉදිරියේ කිසිදු අයුරකින් අපහසුතාවට හෝ අගතියට හෝ පත් නොකිරීමට වග බලා ගැනීම.

2. පන්ති කවවල දී දෙමාපියන් හා සිසුන් අනවශ්‍ය පීඩාවට පත්වන අයුරින් මුදල් එකතු කිරීමෙන් වැළකීම.

3. පන්ති කව පැවැත්වීමට යොදා ගන්නා වේලාව දෙමාපියන්ගේ රාජකාරී කටයුතුවලට බාධා අවම වන අයුරින් පහසු පරිදි යොදාගත යුතු අතර රජයේ කාර්යාලවල මහජන දිනය පැවැත්වෙන සඳුදා දිනය ඒ සඳහා යොදා නොගැනීම.

4. වර්ෂයේ පළමු පාසල් වාරය අරම්භයේ සහ අවසානයේ, දෙවන සහ තෙවන පාසල් වාර අවසානයේ, ආදි වශයෙන් වර්ෂයකට අවමය පන්ති කව 4 ක් වත් අනිවාර්යයෙන් පැවැත්විය යුතු අතර වාර්ෂික ව පන්ති කව පැවැත්වීමට සැලසුම් කළ දින සහ පාසල් ලිත සම්බන්ධයෙන් අදාළ වර්ෂය ආරම්භයේ දී ම දෙමාපියන් දැනුම්වත් කිරීම.

5. චක්‍රලේඛ අංක 35/2023 අනුව පාසල් පරිශ්‍ර දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන, මධ්‍යසාර සහ අනෙකුත් සියලු මත්ද්‍රව්‍යවලින් තොර කලාප බවට පත්කිරීම සඳහා "පාසල් සුමිතුරු සංසද" පිහිටුවීමේ වැඩසටහන මේ වන විට අධ්‍යාපන අමාත්‍යාංශය මගින් ආරම්භ කර ඇති අතර ඊට සමගාමී ව නිවෙස් හා ආශ්‍රිත පරිසර ද දුම්වැටි, දුම්කොළ නිෂ්පාදන, මත්පැන්, මත්ද්‍රව්‍ය හා ආශ්‍රිත නිෂ්පාදනවලින් තොර ව පවත්වාගෙන යාමේ වැදගත්කම සම්බන්ධයෙන් දැනුම්වත් කිරීම.

6. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සුදුසු නිලධාරීන්ගේ සම්පත්දායකත්වය අවශ්‍ය පරිදි ලබා ගනිමින් සිසුන්ගේ පෞද්ගලික ස්වස්ථතාව හා අපයෝජනයන්ගෙන් ආරක්ෂාවීම, ප්‍රවාහන මාධ්‍ය භාවිතයේ දී හා ගමනාගමනයේ දී සුරක්ෂිත ව කටයුතු කිරීම, ආරක්ෂාව සහ පරෙස්සම සම්බන්ධයෙන් තම දරුවන්ට නිසි උපදෙස් ලබාදීම පිළිබඳ ව ද දෙමාපියන් දැනුම්වත් කිරීම.

7. සිසුන්ගේ ප්‍රගතිය , පාසල් පැමිණීම, විෂය සමගාමී හා ක්‍රීඩා සඳහා සහභාගීත්වය ප්‍රවර්ධනය වන ආකාරයේ වැඩපිළිවෙලක් ක්‍රියාවට නැගීම සහ සෑම දරුවකු ම ක්‍රීඩාවක් හා විෂය සමගාමී/ බාහිර එක් ක්‍රියාකාරකමක හෝ නිරත වීමේ වැදගත් බව දැනුම්වත් කිරීම.

8. සිසුන්ගේ පෝෂණ අවශ්‍යතා පිළිබඳ ව සැලකිලිමත් විය යුතු අතර මිල අධික පෝෂණ ගුණයෙන් අවම කෙටි ආහාර වෙනුවට අවම පිරිවැයක් යටතේ පෝෂ්‍යදායී ආහාරපාන ලබා දීම සඳහා දැනුම්වත් කිරීම

9. පාසල් පරිශ්‍රයේ පවිත්‍රතාව හා ඩෙංගු මර්දනය පිළිබඳ විශේෂ අවධානය යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සහ නිවෙස් පරිශ්‍රය ද පවිත්‍ර ව තබා ගැනීමේ වැදගත්කම සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම.

10. විශේෂ අවශ්‍යතා ඇති සිසුන් හඳුනාගෙන පාසල් මට්ටමෙන් ගත හැකි ක්‍රියාමාර්ග ගැනීම, ඔවුන්ගේ දෙමාපියන් දැනුම්වත් කිරීම සහ විශේෂ දක්ෂතා සහිත සිසුන්ගේ එම දක්ෂතා වැඩි දියුණු කිරිමට ගත හැකි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් එම දෙමාපියන් දැනුම්වත් කිරීම.

11. සෑම ශිෂ්‍යයෙකු ම සුවිශේෂී වන බවත් දරුවන් එකිනෙකා සංසන්දනය කිරීම තුළින් ඔවුන්ගේ පෞරුෂ වර්ධනයට හානියක් වන බැවින් දරුවන්ගේ මානසික හා කායික වර්ධන අවශ්‍යතා පිළිබඳ අවබෝධය සහිත ව සමීප ව කටයුතු කළ යුතු බවට දෙමාපියන් දැනුම්වත් කිරීම.

වසන්තා පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය